සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / *All Rights Reserved*

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education – Western Province**

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பரீட்சை - 2019
**Second Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 02 යි. |

නම :-.................................................................

www.mathsland.org

විභාග අංකය :- ................................

නිවැරදි බවට සහතික කරමි.

....................................
ශාලා නිරීක්ෂකගේ අත්සන

**වැදගත් :**

* මෙම ප්‍රශ්න පත්‍රය පිටු **8** කින් සමන්විතය.
* **මෙම පිටුවේත්, තුන්වැනි පිටුවේත්** නියමිත ස්ථානවල ඔබේ **විභාග අංකය** නිවැරදිව ලියන්න.
* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරත් එම පිළිතුර ලබාගත් ආකාරයත් දැක්වීමට ඒ ඒ ප්‍රශ්නය යටින් තබා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න.
* ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී **අදාළ පියවර** හා **නිවැරදි ඒකක** දක්වන්න.
* පහත දක්වා ඇති පරිදි ලකුණු ප්‍රදානය කෙරේ.

  **A කොටසෙහි**
  එක් එක් ප්‍රශ්නයට ලකුණු 2 බැගින්.

  **B කොටසෙහි**
  එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින්.
* කටු වැඩ සඳහා හිස් කඩදාසි ලබාගත හැකිය.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| A | 1 – 25 | |
| B | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| එකතුව | | |


| | |
|---|---|
| ........................<br>පළමු පරීක්ෂක | ........................<br>සංකේත අංකය |
| ........................<br>දෙවන පරීක්ෂක | ........................<br>සංකේත අංකය |
| ........................<br>ගණිත පරීක්ෂක | ........................<br>සංකේත අංකය |
| ........................<br>ප්‍රධාන පරීක්ෂක | ........................<br>සංකේත අංකය |

A කොටස

**ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**


**01.** නිවසක තක්සේරු වටිනාකම රු. 25 000 කි. ඒ සඳහා 6% ක වාර්ෂික වරිපනම් බදු මුදලක් ගෙවිය යුතුය. ගෙවිය යුතු වාර්ෂික වරිපනම් බදු මුදල සොයන්න.

**02.** දී ඇති කේන්ද්‍රික ඛණ්ඩයේ, කේන්ද්‍රය O වේ. එහි අරය 7 cm ක් නම් කේන්ද්‍රික ඛණ්ඩයේ පරිමිතිය සොයන්න.




**03.** විසඳන්න. $\frac{4}{x} = 2$

**04.** ABC ත්‍රිකෝණය හා PQR ත්‍රිකෝණය අංගසම වීමට අවශ්‍යය අනෙක් අංගය ලියන්න. අදාළ අංගසම අවස්ථාව ද ලියන්න.




www.mathsland.org

**05.** වාහනයක මධ්‍යක වේගය පැයට කිලෝමීටර 40 කි. එම වාහනය 200 km ක දුරක් යාමට ගන්නා කාලය සොයන්න.

**06.** සාධක සොයන්න. $x^2 - x - 6$

**07.** $x$ , $2x$ හා $75°$ යනු ත්‍රිකෝණයක කෝණ වේ. එම ත්‍රිකෝණයේ විශාලම කෝණයේ අගය සොයන්න.

**08.** $4x^2$ හා $6xy$ හි කුඩා ම පොදු ගුණාකාරය සොයන්න.

www.mathsland.org

**09.** රු. 80 000 ක් වටිනා පරිගණකයක් ආනයනය කිරීමේ දී තීරු බදු ලෙස රු. 12 000 ක් ගෙවීමට සිදු විය. අය කළ තීරු බදු ප්‍රතිශතය සොයන්න.

**10.** සුළු කරන්න. $\frac{2x}{9} + \frac{x}{3}$

**11.** පහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශ තෝරා යටින් ඉරක් අඳින්න.

**(a)** සෑම සමාන්තරාස්‍රයකම සම්මුඛ පාද සමාන වේ.

**(b)** සෑම සමාන්තරාස්‍රයකම විකර්ණ දිගින් සමාන වේ.

**(c)** සෑම සමාන්තරාස්‍රයකම එක් එක් විකර්ණය මගින් සමාන්තරාස්‍රයේ වර්ගඵලය සමච්ඡේදනය වේ.


**12.** A , B, C , D , E , F , G , H අක්ෂර ලියා ඇති සමාන කාඩ් පත් 8 කින් අහඹු ලෙස කාඩ් පතක් ගන්නා ලදී. එය ස්වර අක්ෂරයක් (vowel) නොවන අක්ෂරයක් ලියා ඇති කාඩ්පතක් වීමේ සම්භාවිතාව ලියන්න.

**13.** සරල රේඛාවක අන්තඃඛණ්ඩය $-1$ ද, අනුක්‍රමණය $\frac{1}{2}$ ද වේ. එම සරල රේඛාවේ සමීකරණය ලියන්න.

**14.** පහත සංඛ්‍යා සමූහයේ මධ්‍යස්ථය සොයන්න.

15 , 19 , 16 , 11 , 18 , 10 , 25

**15.** රූපයේ දී ඇති තොරතුරු ඇසුරින් $x$ හි අගය සොයන්න.





**16.** පහත අසමානතාව විසඳ $x$ ට ගත හැකි උපරිම අගය ලියන්න. ($x$ නිඛිලයකි.)

$$x - 2 \leq 4$$

www.mathsland.org

**17.** දී ඇති වෙන් රූපයේ දැක්වෙන්නේ ඒ ඒ ප්‍රදේශවලට අයත් අවයව වේ.


එම තොරතුරු ඇසුරින් $n(A \cup B)$ ලියන්න.





**18.** දර්ශක ආකාරයෙන් ලියන්න. $\log_2 64 = 6$

**19.** ළමයි 36 ක් සිටින පන්තියක මුළු ළමයි ගණනින් $\frac{5}{9}$ ක් ගැහැණු ළමයි වේ. පන්තියේ සිටින ගැහැණු ළමයි ගණන සොයන්න.

**20.** දී ඇති කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලය සොයන්න. (O කේන්ද්‍රය වේ.)




**21.** දී ඇති රූපයේ $C\hat{D}E = 142^\circ$ හා AC = BC වේ. $A\hat{B}C$ හි අගය සොයන්න.




**22.** ධාරිතාව $2400l$ ක් වූ ටැංකියක් නලයක් මගින් මුළුමනින්ම ජලයෙන් පිරවීමට මිනිත්තු 48 ක් ගත විය. නලයෙන් ජලය ගලා ආ වේගය සොයන්න.


**23.** රූපයේ PQRS සමාන්තරාස්‍රයකි. PX මගින් $Q\hat{P}S$ සමච්ඡේදනය වේ. $P\hat{Q}R = 70^\circ$ නම්, $P\hat{X}S$ හි අගය සොයන්න.




www.mathsland.org

**24.** A නම් අචල ලක්ෂ්‍යයට 7 cm ක් දුරින් චලනය වන ලක්ෂ්‍යයක පථය දළ රූප සටහනකින් දක්වන්න.

**25.** රූපයේ දී ඇති තොරතුරු ඇසුරින් $A\hat{B}D$ හි අගය සොයන්න.



## B කොටස

**ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**


**01. (a) (i)** වගා බිමක් සැකසීමට මිනිසුන් 8 කට දින 6 ක් ගත වේ. එම කාර්යය නිම කිරීමට එක් අයකුට ගත වන දින ගණන සොයන්න.

**(ii)** ඉහත වගා බිම මෙන් තුන් ගුණයක් විශාල වූ වගා බිමක් සැකසීමට මිනිසුන් 16 කට දින කීයක් ගත වේද?

**(iii)** මිනිසෙකුගේ දිනක වැටුප රු. 1 500 ක් නම් ඉහත (ii) කොටසේ සඳහන් කාර්යය වෙනුවෙන් වැටුප් සඳහා වැය වන මුදල සොයන්න.

**(b)** 8% ක වාර්ෂික සුළු පොළී අනුපාතිකයක් යටතේ මුදලක් ණයට ගත් අයෙක් වසර දෙකක් අවසානයේ දී රු. 29 000 ක් ගෙවා ණයෙන් නිදහස් විය. ඔහු ණයට ගත් මුදල සොයන්න.

**02.** අර්ධ වෘත්තයකින් හා සෘජුකෝණී ත්‍රිකෝණයකින් සමන්විත තහඩුවක් රූපයේ දැක් වේ. අර්ධ වෘත්තයේ විෂ්කම්භය 28 cm කි.




**(i)** අර්ධ වෘත්තයේ චාප දිග සොයන්න.

**(ii)** AB දිග BC දිගෙන් $\frac{3}{4}$ ක් නම් AB දිග සොයන්න.

**(iii)** මුළු තහඩුවේ පරිමිතිය සොයන්න.

www.mathsland.org

**(iv)** අර්ධ වෘත්තයේ වර්ගඵලය සොයන්න.

**(v)** මුළු තහඩුවේ වර්ගඵලය සොයන්න.

**03.** විදේශ රැකියා සඳහා පුද්ගලයින් විදේශගත කරන ආයතනයකින් පසුගිය වසරේ දී විදේශ රැකියාවලට යැවූ මුළු පිරිසෙන් $\frac{1}{6}$ ක් රියදුරන් වූ අතර ඉතිරි පිරිසෙන් $\frac{3}{5}$ ක් ගෘහ සේවකයන් වේ.

**(i)** රියදුරු රැකියා හැර වෙනත් රැකියා සඳහා විදේශගත වූ පිරිස මුළු පිරිසෙන් කවර භාගයක් ද?

**(ii)** ගෘහ සේවය සඳහා යැවූ පිරිස මුළු පිරිසෙන් කවර භාගයක් ද?


**(iii)** රියදුරන් හා ගෘහ සේවකයන් ලෙස ගිය පිරිස මුළු පිරිසෙන් කවර භාගයක් ද?

**(iv)** ඉහත සඳහන් රැකියා සඳහා යැවූ පිරිස හැර ඉතිරි පිරිසෙන් $\frac{1}{2}$ ක් පෙදරේරු වෘත්තිය සඳහා යවා ඇත. පෙදරේරුවන් ලෙස පිටත් වූ පිරිස 75 ක් නම් ගෘහ සේවය සඳහා පිටත් වූ පිරිස කොපමණද?

www.mathsland.org

**04. (a)** A = {1 , 4 , 9} නම් A කුලකය වෙනත් කුලක අංකන ක්‍රම මගින් නිරූපණය කරන්න.

**(b)** X හා Y කුලක දෙකක් එහි අවයව ඇසුරෙන් පහත වෙන්රූප සටහන මඟින් නිරූපණය වේ.





**(i)** X කුලකය අවයව සහිතව ලියන්න.

**(ii)** $X \cap Y$ කුලකය නිශ්චිතව හඳුනාගත හැකි පොදු ලක්ෂණයක් මගින් විස්තර කරන්න.

**(iii)** ඉහත සර්වත්‍ර කුලකය තුළින් අහඹු ලෙස තෝරා ගන්නා ලද සංඛ්‍යාවක් 3 ගුණාකාරයක් වීමේ සම්භාවිතාව සොයන්න.

**05.** ප්‍රදර්ශන භූමියක් තුළ තිබූ A , B , C හා D ප්‍රදර්ශන කුටි හතරක් නැරඹීමට පැමිණි නරඹන්නන් සංඛ්‍යාව ඇසුරින් පහත වට ප්‍රස්තාරය ඇඳ ඇත.




**(i)** B කුටියට පැමිණි නරඹන්නන් සංඛ්‍යාවට අදාළ කේන්ද්‍රික ඛණ්ඩයේ කෝණය සොයන්න.

**(ii)** B කුටියට පැමිණි නරඹන්නන් ගණන 200 ක් නම් මෙම කුටි හතර නැරඹීමට පැමිණි මුළු නරඹන්නන් ගණන කීයද?

**(iii)** B කුටිය නැරඹීමට පැමිණි නරඹන්නන්ගෙන් 80% ක් පාසල් සිසුන් විය. එම කුටිය නැරඹීමට පැමිණි පාසල් සිසුන් නොවන නරඹන්නන් ගණන කීයද?

**(iv)** ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි මුළු නරඹන්නන් ගණන A කුටිය නැරඹූ ගණන මෙන් හය ගුණයකි. නරඹන්නන්ගෙන් අහඹුව තෝරාගත් අයෙක් C කුටිය නැරඹූ අයෙක් වීමේ සම්භාවිතාව ලියන්න.

www.mathsland.org

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved



දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பரீட்சை - 2019
Second Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 03 යි. |

- **A කොටසින් ප්‍රශ්න 5 ක් ද B කොටසින් ප්‍රශ්න 5 ක් ද තෝරාගෙන ප්‍රශ්න දහයකට පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් හිමි වේ.**

## A කොටස

**ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**01. (a)** $y = x^2 - 3$ ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීමට පිළියෙල කළ අගය වගුවක් පහත දැක් වේ.

| $x$ | $-3$ | $-2$ | $-1$ | 0 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|
| y | 6 | 1 | ........ | $-3$ | $-2$ | 1 | 6 |

**(i)** $x = -1$ විට y හි අගය සොයන්න.

**(ii)** ප්‍රස්තාර කඩදාසියක් මත සුදුසු පරිමාණයකට ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය අඳින්න.

**(iii)** ප්‍රස්තාරය ඇසුරෙන් හැරුම් ලක්ෂයේ ඛණ්ඩාංකය ලියන්න.

**(iv)** ප්‍රස්තාරය ඇසුරෙන් $x^2 - 3 = 0$ හි මූල සොයන්න.

www.mathsland.org

**(b)** (0 , 2) හා (2 , 8) ලක්ෂ්‍යයන් හරහා යන සරල රේඛාවේ සමීකරණය ලියා දක්වන්න.

**02. (a)** ව්‍යාපාරික ස්ථානයක් වෙනුවෙන් එහි අයිතිකරු කාර්තුවකට රුපියල් 1 200 ක වරිපනම් බදු මුදලක් අදාල පළාත් පාලන ආයතනයට ගෙවිය යුතුය.

**(i)** ගෙවිය යුතු වාර්ෂික වරිපනම් බදු මුදල සොයන්න.

**(ii)** ව්‍යාපාරික ස්ථානයේ වාර්ෂික තක්සේරු වටිනාකම රුපියල් 60 000 ක් නම් අය කරන වාර්ෂික වරිපනම් බදු ප්‍රතිශතය කොපමණද?

**(b)** දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ආදායම් බදු ගණනය කිරීමේ ප්‍රතිශත පහත වගුවේ දැක්වා ඇත.

| වාර්ෂික ආදායම (රු.) | බදු ප්‍රතිශතය |
|---|---|
| පළමු රු. 500 000 | 0% |
| ඊළඟ රු. 500 000 | 4% |
| ඊළඟ රු. 500 000 | 8% |

**(i)** රුපියල් 1 050 000 ක වාර්ෂික ආදායමක් ඇති පුද්ගලයකු ගෙවිය යුතු වාර්ෂික ආදායම් බදු මුදල ගණනය කරන්න.

**(ii)** රුපියල් 48 000 ක් වාර්ෂික ආදායම් බදු මුදල් ලෙස ගෙවීමට සිදු වූ පුද්ගලයකුගේ වාර්ෂික ආදායම කොපමණද?


**03.** **(i)** $(x + \mathrm{m})^2 = x^2 + 6x + \mathrm{n}$ නම්, m හා n හි අගය සොයන්න.

**(ii)** සාධක වෙන් කරන්න. $a^3 - 9a\mathrm{b}^2$

**(iii)** විසඳන්න. $2x - \mathrm{y} = 5$

$x + 3\mathrm{y} = 13$

**04.** තිරස් බිමක පිහිටි P , Q හා R නම් ලක්ෂ්‍ය තුනක දළ පිහිටුම් දැක්වෙන සටහනක් රූපයේ දැක්වේ. සුදුසු පරිමාණයක් තෝරාගෙන P , Q හා R ලක්ෂ්‍යවල පිහිටුම් සහිත පරිමාණ රූපයක් අඳින්න. පරිමාණ රූපය ඇසුරින් P සිට Q ට ඇති දුර හා Q සිට P හි දිගංශය මැන ලියන්න.




www.mathsland.org

**05.** මිරිස් පාත්තියක වූ පැල 25 කින් කඩා ගන්නා ලද මිරිස් කරල් ගණන පහත දැක් වේ.

5 , 7 , 9 , 9 , 6 , 10 , 7 , 6 , 8 , 8 , 9 , 6 , 9

10 , 9 , 5 , 7 , 8 , 10 , 8 , 8 , 6 , 10 , 9 , 5

**(i)** ඉහත තොරතුරු ඇසුරින් පහත දී ඇති වගුව උත්තර පත්‍රයට පිටපත් කරගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.

| **මිරිස් කරල් ගණන ($x$)** | **ප්‍රගණනය** | **පැල ගණන ($f$)** | $f \times x$ |
|---|---|---|---|
| 5 | | | |
| 6 | | | |
| 7 | | | |
| 8 | | | |
| 9 | | | |
| 10 | | | |
| | | $\sum f =$ | $\sum fx =$ |

**(ii)** මෙම සංඛ්‍යාත ව්‍යාප්තියේ මාතය කුමක්ද?

**(iii)** ගසකින් කඩන ලද මිරිස් කරල් ගණනේ මධ්‍යන්‍යය සොයන්න.

**06.** **(i)** $\frac{4}{a+1} = 2 - \frac{3}{a}$ බව දී ඇත්නම් එමඟින් $2a^2 - 5a - 3 = 0$ ලබාගත හැකි බව පෙන්වන්න.

**(ii)** $2a^2 - 5a - 3 = 0$ සමීකරණය විසඳීමෙන් $a$ සඳහා අගයන් දෙකක් ලැබෙන බව පෙන්වන්න.

## B කොටස

**ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**07.** **(i)** $log_5 2 = a$ නම් $log_5 10$ හි අගය $a$ ඇසුරින් ලියන්න.

**(ii)** විසඳන්න. $\log_a x - \log_a 5 = \log_a 3$

**(ii)** ලඝු ගණක වගු භාවිතයෙන් අගය සොයන්න. $\frac{6.914 \times 3.076}{8.619}$

**08.** පහත දැක්වෙන නිර්මාණ සඳහා cm / mm පරිමාණයක් සහිත සරල දාරයක් හා කවකටුවක් පමණක් භාවිත කරන්න. නිර්මාණ රේඛා පැහැදිලිව දක්වන්න.

**(i)** AB = 5 cm , AD = 5 cm හා $B\hat{A}D = 60°$ වන පරිදි ABD ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

**(ii)** $B\hat{A}D$ හි සමච්ඡේදකය නිර්මාණය කරන්න. එම සමච්ඡේදකය BD පාදය හමුවන ලක්ෂ්‍යය X ලෙස නම් කරන්න.

**(iii)** දික්කළ AX මත C පිහිටන සේ ද, AX = XC වන සේ ද ABCD චතුරස්‍රය නිර්මාණය කරන්න.

**(iv)** BC දිග මැන ලියන්න.

**(v)** ABCD චතුරස්‍රය හැඳින්විය හැකි විශේෂ නාමය කුමක්ද?

www.mathsland.org

**09.** ABC ත්‍රිකෝණයේ $A\hat{C}B = 3A\hat{B}C$ වේ. $B\hat{A}C$ හි සමච්ඡේදකයට BC පාදය E හි දී හමු වේ. දික්කළ AE මත D පිහිටා ඇත්තේ $A\hat{D}B = 90°$ වන පරිදිය. BC මගින් $A\hat{B}D$ සමච්ඡේද වන බව පෙන්වන්න. (ඉගිය $A\hat{B}C = x$ හා $B\hat{A}D = y$ ලෙස ගන්න.)

**10.** ABC ත්‍රිකෝණයේ $B\hat{A}C$ යේ සමච්ඡේදකය D හි දී BC පාදය සමච්ඡේදනය කරයි. AD = DE වන සේ AD රේඛාව E දක්වා දික්කර ඇත.

**(i)** ඉහත තොරතුරු දළ සටහනක් මඟින් දක්වන්න.


හේතු දක්වමින් පහත ඒවා සාධනය කරන්න.

**(ii)** ABEC සමාන්තරාස්‍රයක් බව

**(iii)** AC = CE බව

**(iv)** ABC සමද්විපාද ත්‍රිකෝණයක් බව

**11.** පාසලක ගණිතාගාරයේ බිත්තියක ඇඳ තිබූ වෘත්ත ඛණ්ඩයක රූප සටහනක් මෙහි දැක් වේ. එහි OX = r ද OA = 2r ද වේ. රූපයේ අඳුරු කළ කොටසේ පරිමිතිය හා වර්ගඵලය පිළිවෙලින් P හා A මඟින් දැක් වේ නම්,




**(i)** $P = r(\pi + 2)$ බව ද

**(ii)** $A = \frac{1}{2}\pi r^2$ බව ද පෙන්වන්න.


**12. (a)** දී ඇති වෙන් රූප සටහනේ දැක්වෙන ε , X හා Y කුලක පහත පරිදි වේ.

ε = {වෛද්‍ය සායනයකට පැමිණි රෝගීන්}

X = {වයස අවුරුදු 40 ට වැඩි රෝගීන්}

Y = {කාන්තා රෝගීන්}


www.mathsland.org




**(i)** වෙන් රූපයේ අඳුරු කර ඇති ප්‍රදේශයෙන් දැක්වෙන පිරිස වචනයෙන් විස්තර කරන්න.

**(ii)** එම පිරිස කුලක අංකනයෙන් ලියා දක්වන්න.

**(b)** ඉහත සායනයට සහභාගී වූ රෝගීන් පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු දැක්වෙන අසම්පූර්ණ වෙන් රූප සටහනක් පහත දැක්වේ.




**(i)** $x$ මගින් දැක්වෙන පිරිස කුලක සූත්‍ර භාවිතයෙන් හෝ අන් අයුරකින් හෝ ගණනය කරන්න.

**(ii)** මෙම වෙන් රූප සටහන ඔබේ පිළිතුරු පත්‍රයට පිටපත් කරගෙන එය සම්පූර්ණ කරන්න.

**(iii)** මෙම සායනයට සහභාගී වූ රෝගීන් අතුරින් එක් අයෙකු අහඹු ලෙස තෝරා ගතහොත් එම රෝගියා වයස අවුරුදු 40 හෝ ඊට අඩු කාන්තාවක් වීමේ සම්භාවිතාව ලියන්න.

